# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2016/48 - 2017 අප්‍රේල් මස 28 වැනි සිකුරාදා - 2017.04.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය* : BD/EL/LND/2/AQUSN/14.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/9/2015/WS/107.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර*:

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුඹල්වෙල කෝරළේ සුළු කොට්ඨාසයේ, අංක 68 සී, මධුරගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ගොටුවෙල ගමේ පිහිටි සර්වේයර් ජෙනරාල් විසින් මැන සකස් කරන ලද, 2017.01.30 වැනි දිනැති අවසාන ගම් පිඹුරු අංක 2A, අතිරේක අංක 13 හා පත්‍ර අංක 15 දරන පිඹුරේ කැබලි අංක 291 වශයෙන් දැක්වෙන ''පිටවෙල අරාව *හෙවත්* නෙදර්විල් වත්ත'' නැමති ඉඩමෙන්, මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0998 ක් පමණ වන පහත මායිම් තුළ පිහිටි ඉඩම් කොටස: -

1. කැබලි අංක 291
ඉඩමේ නම: පිටවෙල අරාව *හෙවත්* නෙදර්විල් වත්ත; ප්‍රමාණය: හෙක්. 0.0998

මායිම්:
උතුරට: කැබලි අංක 38; නැගෙනහිරට: කැබලි අංක 38 සහ 40; දකුණට: කැබලි අංක 40 සහ 38; බටහිරට: කැබලි අංක 38

හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපිනයන්; 1, ඒ. හපුගස්තැන්න වැවිලි සමාගම (පී. එල්. සී.), අංක 95 ඒ, නම්බපාන, ඉංගිරිය

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 ජූලි මස 27 වැනි දින පෙ. ව. 10.00 ට ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2017 ජූලි මස 20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

කේ. ඩී. තනුක්ෂා එන්. අබේවර්දන,
ප්‍රාදේශීය ලේකම්,
ඇල්ල.

2017 අප්‍රේල් මස 25 වැනි දින,
ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05 - 412


1A - G 25491 - 32 (2017/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.